# මනසේ පැවැත්ම

මනස, මනස හැරෙන්නට වෙනත් කිසිම ඉන්ද්‍රියකට ගෝචර නො වෙයි. එහෙත් බටහිර විද්‍යාවට අනුව මනස ඉන්ද්‍රියක් ද නො වෙයි. බටහිරයන්ට මනස ගැන අධ්‍යයනයකිරීමේ දී ප්‍රධාන බාධකයක් බවට පත්වී ඇත්තේ මේ කරුණ යැයි සිතිය හැකි ය. මනස ඉන්ද්‍රියයක් ලෙස පිළිගැනීමට බටහිරයන්ට බාධකයක් වනුයේ ඔවුන් දන්නා ඉන්ද්‍රිය යම් අවයව හා සම්බන්ධ වීම නිසා.යැයි සිතිය හැකි ය. ඇස කණ ආදිය එවැනි අවයව වෙයි. එහෙත් මනස හා සම්බන්ධ ඉන්ද්‍රියයක් සොයාගත හැකි නො වෙයි.

මොළයේ ඇතැම් කොටස්වලට ඉලෙක්ට්‍රෝඩ සවිකර යම් යම් සිතිවිලි පහළ වන විට ඒ ඉලෙක්ට්‍රෝඩ ඔස්සේ මොළයේ යම් යම් කොටස් ක්‍රියාකාරීවන බැව් දැනගතහැකි බව කලින් සඳහන්කෙරී ඇත. ඒ සමග අප පවසා ඇත්තේ ඒ හේතුවෙන් මනස යනු මොළයේ ක්‍රියාකාරකම් නිසා ඇතිවන්නක් යැයි නිගමනයකිරීමට නොහැකි බව ය. ඉලෙක්ට්‍රෝඩ සවිකර සිදුකරන පරීක්ෂණවලින් හෙළිවන්නේ යම් යම් සිතිවිලි ඇතිවන විට මොළයේ ද ඒ ඒ කොටස් ක්‍රියාකාරීවන බව පමණ ය. ඉන් එහාට කිසිවක් නිගමනයකිරීමට නො හැකි ය. මනස යනු මොළයේ ක්‍රියාකාරීත්වයේ ප්‍රතිඵලයක් නොව, මනස ක්‍රියාත්මක වන විට මොළයේ ඒ ඒ කොටස් ක්‍රියාත්මක වන බව නම් එයින් නිගමනය කළ හැකි ය.

මොළයේ යම් කොටසක් ඉවත්කළ පසු ද එයට අදාළ යැයි පැවසෙන මනසේ ක්‍රියාකාරීකම් තවදුරටත් සිදුවන බව බටහිර විද්‍යාඥයෝ ම දනිති. මනස යනු මොළයේ ක්‍රියාකාරීත්වය නිසා හටගන්නක් නම් එලෙස කොටසක් ඉවත්කිරීමෙන් පසුවත් අදාළ කාර්යය සිදුවන්නේ කෙසේ ද යන ප්‍රශ්නයට සංගත ව පිළිතුරු දීම පහසු කාර්යයක් නො වෙයි. එහෙත් මනසේ යම් සිතිවිල්ලක් ඇතිවන විට මොළයම ක්‍රියාත්මක වන බවත් ඉන් ඇතැම් කොටසක් අනෙක් කොටස්වලට වඩා ක්‍රියාත්මක වන බවත් අප කිවහොත් කලින් නගන ලද ප්‍රශ්නවලට ඒ සමග පිළිතුරු ද ලැබෙයි. මොළයේ යම් කොටසක් ඉවත්කළ ද, යම් සිතිවිල්ලක් ඇතිවීමේ දී සමස්ත මොළයම ක්‍රියාත්මක වන බැවින් ඒ සිතිවිල්ල සමග මොළයේ වෙනත් කොටසක් වඩා ක්‍රියාත්මක වන කොටස බවට පත්විය හැකි ය.

මනස යනු මොළය ක්‍රියාත්මක වීමේ ප්‍රතිඵලයක් නොව මනස ක්‍රියාත්මක වීමත් සමග මොළය ද ඇතැම් විට යම් ආකාරයකට ක්‍රියාකාරීවීමට පටන්ගැනෙන්නේය යන්න ඉලෙක්ට්‍රෝඩ නිරීක්ෂණවලින් ලබාගත හැකි නිගමනය යැයි සිතමි. යමක් එසවීමට හෝ යමකට පහරදීමට හෝ අවශ්‍ය වු විට අත ක්‍රියාත්මක වෙයි. එසේත් නැතහොත් අපි අත ක්‍රියාත්මක කරමු. එසවීම යන සිතිවිල්ලෙහි ප්‍රතිඵලයක් ලෙස අත එසවෙයි. නැතහොත් වෙනත් ආකාරයකට චලනය වෙයි. ඒ බව නිරීක්ෂණය කරන යමකු එසවීම යන සිතිවිල්ල ඇතිවන්නේ අත ඉබේ එසවීමත් සමග යැයි නිගමනය කළහොත් අපි ඒ පිළිගනිමු ද? අත යනු අවයවයක් වෙයි. මොළය යන්න ද අවයවයක් වෙයි. ඒ ඒ අවයවවලට ඒ ඒ ක්‍රියාකාරීත්වයන් හිමිවෙයි. මනසේ ක්‍රියාකාරීත්වයත් සමග ඒ ඒ අවයව ද ක්‍රියාත්මක වෙයි.

මොළය ආශ්‍රිත සිතිවිලි හැරෙන්නට මොළය ආශ්‍රිත නොවන සිතිවිලි ද තිබෙ ද? බටහිර විද්‍යාවට ඒ ප්‍රශ්නයට එක එල්ලේ ම පිළිතුරක් දිය හැකි යැයි මම නොසිතමි. එහෙත් ඉලෙක්ට්‍රෝඩ ඔස්සේ කරන නිරීක්ෂණවලින් නිගමනය කෙරෙන ආකාරයට නම් එවැනි මොළය ආශ්‍රිත නොවන සිතිවිලි තිබිය නො හැකි ය. ඒ මනස යනු මොළයේ ක්‍රියාත්මකවීම නිසා ඇතිවන්නක් ලෙස නිගමනයකෙරී ඇති බැවින් උද්ගතවන තත්ත්වයකි. එහෙත් එවැනි නිගමනයකට එළඹීමට අවශ්‍ය තරම් නිරීක්ෂණ කෙරී ඇත් ද?

මෙයට අදාළ තවත් ප්‍රශ්න වෙයි. මිනිසකු හා වෙනත් සත්ත්වයකු අතර ඇති වෙනස කුමක් ද? බටහිර විද්‍යාවට අනුව ඒ වෙනස තේරුම්ගන්නේ මිනිසුන්ට මනස් ඇති බවත් අනෙක් සත්ත්වයන්ට මනස් නැති බවත් කීමෙන් ද? එසේ නම් අනෙක් සත්ත්වයන්ගේ මොළ ගැන කිව හැක්කේ කුමක් ද? අනෙක් සතුන්ගේ ද මොළවලට ඉලෙක්ට්‍රෝඩ සවිකර කෙරී ඇති පරීක්ෂණ වෙයි ද? එවැනි පරීක්ෂණ බටහිර විද්‍යාඥයන් නො කරන්නේ ද? අනෙක් සත්ත්වයන්ගේ මොළ හා මිනිසුන්ගේ මොළ අතර වෙනසක් වෙයි ද? අනෙක් ඇතැම් සතුන් ද වැඩිහිටි සතුන්ගේ හැසිරීම ඇසුරෙන් යම් යම් දේ ඉගෙන ගන්නා බව අද බටහිර විද්‍යාඥයෝ ම පවසති.

© Prof. Nalin De Silva

ඒ සමග ඇසිය හැකි තවත් ප්‍රශ්නයක් නම් මිනිසකු මිය යෑම යනුවෙන් අදහස්කරන්නේ කුමක් ද යන්න ය. ඒ මොළයේ අක්‍රිය වීම ද? (මොළය මිය යෑම ද?) මොළය අක්‍රිය වීමෙන් පසුව ද මිනිසුන් ජීවත්වන්නේ ද? මේ ප්‍රශ්නවලට සංගත පිළිතුරු ලබාදීම බටහිර විද්‍යාඥයන්ගේ කාර්යභාරය වෙයි.

කෙසේ හෝ වේවා මනසක් නැතැයි ඇතැම් බටහිර විද්‍යාඥයන් නිගමනය කරන්නේ ද මෙරට සිටින ඇතැම් අනුකාරක මහත්වරු ඒ නිගමනය පුනරුච්චාරණයකරන්නේ ද මනස දැකගත නොහැකි බැවින් ය. වෙනත් වචනවලින් කියන්නේ නම් මනස ඉන්ද්‍රිය ගෝචර නොවන බැවින් ය. එහෙත් කලින් සඳහන්කර ඇති පරිදි ගුරුත්වාකර්ෂණ ක්ෂෙත්‍රය (බලය) ද ඉන්ද්‍රිය ගෝචර නො වෙයි. එහෙත් බොහෝ බටහිර විද්‍යාඥයන්ට ගුරුත්වාකර්ෂණ ක්ෂෙත්‍රයක් ඇතැයි පිළිගැනීම අසීරු කරුණක් නො වෙයි.

මේ ප්‍රශ්නයේ දී බලපාන තවත් කරුණක් ද වෙයි. ඒ බටහිර විද්‍යාඥයන් මනස ඉන්ද්‍රියක් ලෙස නොපිළිගැනීම හේතුවෙන් ඇතිවන්නකි. මනස ඉන්ද්‍රියයක් ලෙස නොගැනීමට ද බලපාන්නේ ඒ හා සම්බන්ධ අවයවයක් දැකගැනීමට නොහැකි වීම ය. බටහිරයන් ඉන්ද්‍රිය හා ඉන්ද්‍රිය ගෝචර යනුවෙන් අදහස්කෙරෙන්නේ කවරක් දැයි අපි කෙටියෙන් විමසා බලමු. ඉන්ද්‍රියයක් යනු අවයවයක් යැයි සිතීමට බොහෝ දෙනා පුරුදු වී සිටිය ද, ඉන්ද්‍රිය යනු අවයව නො වෙයි. ඇස යනු අවයවයකි. එහෙත් ඇස යනු චක්ඛු යනුවෙන් දැක්විය හැකි ඉන්ද්‍රිය නො වෙයි. හම යනු අවයවයකි. එය අපේ ශරීරය පුරාම මෙන් පවතියි. එහෙත් හම යනු ඉන්ද්‍රියයක් නො වෙයි. එහි දී ඉන්ද්‍රිය වනුයේ ස්පර්ශේන්ද්‍රිය ය. ස්පර්ශේන්ද්‍රිය තිබීමට හම තිබිය යුතු ය. හමක් නොමැතිව ස්පර්ශේන්ද්‍රියක් නැත.

මෙහි දී වැදගත් ම කරුණ වනුයේ හම තිබූ පමණින් ස්පර්ශේන්ද්‍රිය නොතිබීම ය. ගෙදර ඇති මුව හමට තඩිබෑම පහසු කාර්යයකි. එහි දී තඩිබෑම හේතුවෙන් මුවා නො දුවයි. එයට හේතුව හමක් තිබුණ ද මුවෙක් නො සිටීම ය. ගෙදර තිබෙන මුව හමට පමණක් නොව මළ මුවකුගේ හමට තඩිබෑව ද මුවා නො දුවයි. ඒ මුවාට තඩිබෑම නොදැනෙන බැවින් ය. සමහරවිට ඇතැම් බටහිර විද්‍යාඥයකු එයට විරුද්ධවීමට ඉඩ ඇත. එවැන්නකු මුවාට දැනෙන්නේ ය යන්නෙන් අදහස්කරන්නේ කුමක් ද යන ප්‍රශ්නය හෝ මුවාට දැනෙන බව අප දන්නේ කෙසේ ද යන ප්‍රශ්නය හෝ ඇසීමට ඉඩ ඇත. ඒ ගැන තර්ක විතර්ක ඉදිරිපත්කිරීම පසෙක තබා අපට එවිට කළ හැක්කේ මිය ගිය මිනිසකුගේ මළ සිරුරට අත තැබුවත් ඒ මියගියට නොදැනෙන බව මතක්කිරීම ය.

මෙයින් කියැවෙන කරුණ නම් අවයවයක් තිබූ පමණින් අදාළ ඉන්ද්‍රිය නොපවතින බව ය. ඉන්ද්‍රියක් යනු අවයවයකට වඩා වැඩි දෙයකි. ඉන්ද්‍රියක් ක්‍රියාකාරීත්වයේ පවතින්නේ ම මනස ඇත්නම් ය. මොළය ද අවයවයකි. මොළය තිබූ පමණින් මොළය වුව ද ක්‍රියාත්මක නො වෙයි. ඒ සඳහා ද මනසක් අවශ්‍ය වෙයි. මිනිසාට සෘජුව ම දැනෙන එකම ඉන්ද්‍රිය මනස ය. මනසක් ඇති බව දැනෙන්නට වෙනත් අවයවයක් අවශ්‍ය වන්නේ වක්‍රව මිස සෘජුව නො වෙයි. එහෙත් වෙනත් ඉන්ද්‍රියක් ක්‍රියාත්මක වීමට අදාළ අවයවය හැරෙන්නට මනස ද අවශ්‍ය වෙයි. වෙනත් වචනවලින් කියන්නේ නම් විඥානය ද අවශ්‍ය වෙයි. එබැවින් අනෙක් ඉන්ද්‍රිය ගැන කතාකිරීමට පෙර මනස ඉන්ද්‍රියක් ලෙස පිළිගත යුතුව ඇත. එහෙත් බටහිර විද්‍යාව හා අනෙක් බටහිර දැනුම් විසින් මනස ඉන්ද්‍රියක් ලෙස සලකනු නො ලැබෙයි. මෙරට සිටින බටහිර විද්‍යාව, විශේෂයෙන් ම භෞතවේදය වැනි විෂය, උගත් අය මනස ඉන්ද්‍රියක් බව නො පිළිගනිති. එසේ නොපිළිගන්නේ ඔවුන්ගේ මනසකින් කල්පනාකර නොව බටහිරයන්ගේ මනසින් නිර්මාණය වන දෑ අනුකාරක ව ගැනීමෙන් ය.

බටහිරයන් මනස ගැන එසේ සිතුව ද , නැතහොත් ඇතැමුන් මනසක් නැතැයි කීව ද, සිංහල බෞද්ධයන්ට නම් මනස යනු ඉන්ද්‍රියක් වෙයි. ඔවුන්ට අනෙක් ඉන්ද්‍රින්ට වඩා මනස වැදගත් වෙයි. සිංහල බෞද්ධයන්ට මනස යනුවෙන් ඉන්ද්‍රියක් පැවතීමට අදාළ අවයවයක් භෞතික වශයෙන් පැවතීම අවශ්‍ය නො වෙයි. පැවතීම යන සංකල්පය ම සිංහල බෞද්ධයනට ගෙන දෙන්නේ සාපේක්ෂක අර්ථයකි. මනස ද පවතින්නේ සපේක්ෂ අර්ථයකින් මිස නිරපේක්ෂ අර්ථයකින් නො වෙයි.

සිංහල බෞද්ධ සංස්කෘතියෙහි කිසිවක් නිරපේක්ෂව නො පවතියි. ඒ අර්ථයෙන් පුටු, මේස ආදිය පමණක් නොව මනසක් ද නැත. සිංහල බෞද්ධයන් අනෙක් අයගෙන් වෙන්වන්නේ මේ කරුණ නිසා ය. ඇතැම් සංස්කෘතීන්හි

© Prof. Nalin De Silva

භෞතික යැයි කියන දෑ නොපවතින අතර ඒ සියල්ල යම් ආකාරයකින් මනසේ නිර්මාණ වෙයි. එනම් අනෙක් භෞතික යැයි කියන දෑ මනසට සාපේක්ෂ වෙයි. එවැනි සංස්කෘතීන්හි මනස නිරපේක්ෂ වෙයි. මේ සංස්කෘතීන්හි චින්තනයේ එක් සංරචකයක් වූ ඥානවිභාගය විඥානවාදී යැයි කියැවෙයි.

ඒ අතර තවත් සංස්කෘතීන්හි භෞතික යැයි කියන දේ පමණක් පවතියි. එහි මනස නිර්මාණය වන්නේ භෞතික දෑ ඇසුරෙන් ය. මේ සංස්කෘතීන්හි ඥානවිභාගය ද්‍රව්‍යවාදී වෙයි. ඇතැම් ඇට්ටකුණා වූ ද්‍රව්‍යවාදී දර්ශනවල මනසක් කියා දෙයක් නැත. කසිකබල් මාක්ස්වාදය එවැනි දර්ශනයක් මත පදනම් වෙයි. මේ දර්ශනය මත පදනම්වන විද්‍යාවට අනුව මනස ඇතිවන්නේ මොළයේ විකාශය ඔස්සේ ය. ඔවුන් සිතන්නේ ඇත්තේ මොළය පමණක් බව ය. එහෙත් එසේ කියන්නන්ගේ මොළය එතරම් හොඳින් වැඩ නොකරන බවත් ඔවුන් ඌනිතවාදීන් හා නියතිවාදීන් බවත් පෙන්වා දිය හැකි ය. ඔවුන්ගේ නියතිවාදයෙහි ඇති බංකොලොත්බව අපි කලින් දුටුවෙමු

ලෝකයේ ද්‍රව්‍යවාදී හෝ විඥානවාදී හෝ නොවන එකම දර්ශනය ඇත්තේ සමහරවිට සිංහල බෞද්ධයනට පමණක් විය හැකි ය. වෙනත් ජාතියකට හෝ ජනවර්ගයකට හෝ, ද්‍රව්‍යවාදී හෝ විඥානවාදී හෝ නොවන දර්ශනයක් ඇතැයි කිව නො හැකි ය. එසේ නැතැයි නිශ්චිතව කිව නොහැක්කේ ලෝකයේ ඇති සියළු දර්ශන ගැන ලියැවුණු ලිපි ලේඛන නොමැති බැවින් ය. එහෙත් සිංහල බෞද්ධයනට ද්‍රව්‍යවාදී හෝ විඥානවාදී හෝ නොවන දර්ශනයක් ඇති බව නම් අපි නිශ්චිතව දනිමු.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva